ස.සේ.කො.චක්‍රලේඛ අංක : 04/2021

මගේ අංකය : ස.සේ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2021.03.08

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩල වල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී/ කළමනාකරු

**<u>ස.සේ.කො 02/2019 චක්‍රලේඛය අනුව තනතුරේ ශ්‍රේණි උසස් කිරීම් සංශෝධනය කර ඇති සේවකයින් සම්බන්ධයෙනි.</u>**

ස.සේ.කො අංක 02/2019 හා 2019.03.08 දිනැති චක්‍රලේඛය අනුව, අනුමත කරන ලද ශ්‍රේණි උසස්වීම් සංශෝධනය කරන ලද හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව එදිනට ලබමින් සිටි වැටුප පෞද්ගලික වන සේ ලබා දීමට කටයුතු කරන ලද සේවකයින් ඔබ සමිතියේ සිටී නම්, ස.සේ.කො අංක 03/2020 නව වැටුප් චක්‍රලේඛය අනුව, එවැනි සේවකයින් අවසන් වරට ලබමින් සිටි වැටුප පදනම් කර ගනිමින් ඔවුන්ගේ වැටුප පරිවර්තනය නොකළ යුතුය.

02. ඒ අනුව එම සේවකයින්ගේ වැටුප පරිවර්තනය කළ යුත්තේ එකී ශ්‍රේණි උසස්වීම් සංශෝධනය අනුව එදිනට හිමි විය යුතු වැටුප සැළකිල්ලට ගෙනය.

03. එහිදී සේවකයා මෙතෙක් ලබමින් සිටි වැටුප හා ස.සේ.කො චක්‍රලේඛ 02/2019 ශ්‍රේණි සංශෝධනය අනුව ලැබිය යුතු වැටුප අතර යම් වෙනසක් පවතින්නේ නම්, එම වෙනසේ අගයට සමාන මුදල ඔවුනට පෞද්ගලික වන සේ දීමනාවක් වශයෙන් ගෙවිය යුතුය.

04. මෙම චක්‍රලේඛය 2021.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව බව ද දැනුම් දෙමි.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ. හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
වයඹ පළාත.

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

<u>පිටපත්</u>- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.